# රාවණා, තායිලන්තය හා රාමායනය

හිස් දහයකින් යුතු දුෂ්ඨ යක්ෂ ගෝත්‍රික රජෙකු ලෙස, භාරතයේදී රචිත රාමායනය නොහොත් රාමගේ ආදර කතාන්දරය විසින් රාවණා රජුව හදුන්වා දී ඇත. ගිනිකොන දිග ආසියාවට ඉන්දියානු වෙළදුන් විසින් 8 සහ 9 වන ශතවර්ෂ කාල වකවානුවේදී මෙම රාමායනය හදුන්වා දී ඇත. මෙහි ප්‍රතිපලයක් වශයෙන් මෙම ආසියානු රටවල චිත්‍ර, පිළිම, නාට්‍ය, කථාන්දර, මෙම රාමායනය ආශ්‍රයෙන් බිහි වූ බවක් දක්නට ඇති අතර එමගින් ඒවා එම රටවල සංස්කෘතියේ අංගයන් වී ඇත. මෙම හින්දු පුරාවෘත්තයට අනුව රවණා යනු බලය අතින් ඉතා ඉහල තලයේ සිටිනා ඉතා දුෂ්ඨ චරිතයකි. සිය නැගණියගේ නාසය කපා දැමීම ගැන උරණ වූ රාවණා එම පළිය ගැනීමට සීතා දේවිය පැහැරගෙන අවුත් ලංකාපුරයේ (ශ්‍රී ලංකාව) සගවනු ලබයි. පසුව රාම විසින් සිය බිරිඳ සීතා දේවිය බේරා ගනී. එහිදී රාමා සහ ඔහුගේ වානර හමුදාව විසින් රාවණා රජු පරාජය කරයි.

රාවණා රජු නිරූපනය වන සිතුවම්, පිළිම ආදිය ගිනිකොණ දිග ආසියානු රටවල බොහෝ සේ දක්නට ඇත. එමගින් අපට අනුමාන කල හැක්කේ ඉන්දියානු රාමායනය හින්දු ප්‍රබන්ධයක් වුවත් එය පුළුල් ලෙස අන් රටවලටද පැතිර ගොස් ඇති බවයි. තායිලන්තය ඉන් එක් රටකි. එය බෞද්ධ රටක් වුවද හින්දු බලපෑම හොඳින් ලැබී ඇත. තායිලන්තයේ රාමායනය උත්තම රාම යන අරුත දෙන "රමාකයින්" (Ramakien) යන වදනින් හැඳින් වේ. තායිලන්තය තුල රාමායණය නම් හින්දු කතා පුවත ජනප්‍රිය වූයේ 8-9 ශත වර්ෂ වලදී බව සැලකිය හැකිය. එම කතා පුවත තායිලන්තය තුල වැදගත් කතා පුවතක් ලෙස අදටත් සැලකෙන අතර මෙම තායි සහ හින්දු කතා පුවත් අතර පැහැදිලි වෙනස්කම්ද දක්නට ඇත. වර්තමානයේ තායිලන්තය මෙම රාමායනය සම්බන්ධ කතාපුවත හා එය නිරූපනය වන ස්ථාන සිය සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට යොදා ගන්න බව පෙනේ. මෙම කතා පුවත සම්බන්ධ චිත්‍ර, මූර්ති ආදිය ගුවන්තොටුපොල, වෙහෙර විහාර, ආදී ස්ථාන වල පවා දක්නට ඇත. සමහර වෙහෙර විහාර නැරබීමට සංචාරකයින්ගෙන් මුදල් පවා අය කරයි.තායිලන්තයේ අතීතයේ අයෝ-ධ්‍යා නමින් නුවරක් (අයුත්තායා) තිබූ බවටත් එය රාමගේ නිජබිම වූ බවටත් මතභේදයට තුඩු දෙන ප්‍රතිවිරුද්ධ මතයක් අද වන විට ඉස්මතුවෙමින් පවතී. වර්තමාන බැංකොක් නුවර ඇති විශාල වෙහෙර විහාර අතර ගෝල්ඩන් ටෙම්පල් හී ඇති බිතුසිතුවම් හා පිළිම ආදිය මෙයට හොඳ සාක්ෂියකි. තායිලන්තයේ හනුමාන් වන්දනාව, තායි කික් බොක්සිං සටන් කලාව ආදිය ඉතා ප්‍රබලව දක්නට ඇත.

Lak Viskam







බැංකොක් ජාත්‍යන්තර ස්වර්ණභූමි ගුවන්තොටුපොළේ රාවණා පිළිමයක් හා ග්‍රෑන්ඩ් ප්ලේස් හි ගෝල්ඩන් ටෙම්පල්

වර්ෂ 1767 දී "අයුත්තායා" (Ayutthaya) - (සියාම් රාජධානියේ අගනුවර) විනාශ වීමෙන් වටිනා තායි ලිපි ලේඛන රැසක් අහිමි විය. 1790 දී රාමා 1 රජු (ප්‍රා බුද්ධයොද්ෆුලලොක් රජු -King Phra Buddhayodfachulalok) විසින් සිය රාජකීය මාලිගය බැංකොක් නුවර පිහිටුවීමත් සමග ඔහු විසින් මෙම විනාශ වූ ලිපි නැවත ලිවීමට සිය සම්පූර්ණ

කාලය කැප කරන ලදී. මෙහිදී "රමාකයින්" (Ramakien) අද කියවීමට ලැබෙන ආකාරයට රචනා කරන ලද්දේ ඔහු විසිනි. රාමායනයේ මෙම තායි කතා පුවත දීර්ඝ එකක් ලෙස සැලකිය හැකිය. රාමා 1 රජු එයට  කොටස් 40 ක් එකතු කර ඇති අතර තායිලන්තයට අනන්‍ය වූ අංග රැසකින් අලංකාර කර ඇත.

තායිලන්ත රාමායනයේ සීතා යනු රාවණාගේ දුවක ලෙසත්, ඇය ඉපදීමේ ප්‍රතිපලයක් වශයෙන්  ඇය නිසා යක්ෂ ගෝත්‍රය සහ රාවණාගේ රාජධානිය  විනාශ වන බවත්, එමෙන්ම රාජධානියෙන් පිටමන් වන බවත් අනාගත වාක්‍යයක් මගින් කියවී තිබිණ. රාවණා පරාජය වීමෙන් මෙම අනාගත වාක්‍යයේ සත්‍යතාවය තහවුරු වේ. රාවණා මනුෂ්‍යත්වය ඉක්මවූ ගුණාංග වලින් පරිණත අයෙක් ලෙසත් ඔහුට හිස් 10ත් 1000ත් අතර ප්‍රමාණයක් තිබී ඇති බවත් දැක් වේ.එසේම ඔහුට යක්ෂ පෙනුමක් ලැබෙන අංග වන දළ සහ එළියට නෙරා ආ විශාල ඇස් ද තිබී ඇත. ඔහුගේ රුව යමෙක් සිත තුල මවා ගතහොත් හිස් කිහිපයක් සහිත රෞද්‍ර බව නිසාම ඔහුගෙන් කෙරෙන්  භයානක හා බලවත්  මතු වේ. එහෙත් ඔහුගේ ඇඳුම ඉතා අලංකාර තායි රාජකීය ඇඳුමක් වන අතර  රන් පැහැති මුදු හා කර වළල්ලකින්ද යුතු වේ. බැංකොක්හී පිහිටි රාජකීය මාළිගයේ රාවණාගේ වර්ණ නැවත තද වර්ණ ගන්වා ඇති අතර එයට පෙර එහි දක්නට ඇති අනිකුත් යක්ෂ ගොත්‍රිකයන්ට අලේප කර ඇති  වර්ණ වලට සමාන වර්ණයකින් තිබෙන්නට ඇතියයි අනුමාන කලහැක. සුවිශේෂී බලයන්ගෙන් පරිපූර්න වූ මෙම රජුගේ පිළිම පන්සල් ආදී ගොඩනැගිලි  වල ඇතුළුවීමේ දොරටු අසල පිහිටුවා තිබීමෙන් බලාපොරොත්තු වන්නට ඇත්තේ ආරක්ෂකයෙක් වශයෙන් නපුරන් බිය ගන්වා පලවා හැරීම විය යුතුය.




වට් ප්‍රා කෙයෝ විහාරයේ ඇති රාම- රාවණ යුද්ධයේ සිතුවම්

Lak Viskam

**දසකාන්ත නොහොත් ටොසකාන්ගේ (රාවණා) පෙර භවය**

රාවණා තායිලන්තයේදී ‘ටොසකාන්' (Tosakan) දසකාන්ත (Dasakantha) යන නමින්ද හඳුන්වයි. ඔහුට අඳුරු කොළ පැහැති ශරීරයක් වර්ණ ගන්වා ඇතත් ඔහු පාලකයෙකුව සිටි අවදියේදී ශරීර වර්ණය රන්වන් පැහැය වේ. ඔහුගේ පෙර ආත්මභාවයේ නන්දක නමින් සේවක දේවතාවකු ලෙස ටිබෙටයේ 'කයිලාස' (Kailasa) කඳු පන්තියේ විසූ බවත් ඊශ්වර (ශිව) දෙවියන් බැහැ දැකීමට පැමිණෙන දෙවියන්ගේ පා දෝවනය කිරීම නන්දක විසින් කල බවටත් සඳහන් වේ. මෙසේ පැමිණෙන දෙවියන් ඔහුව විනෝදය පිණිස යොදා ගත් බවත් කාලය ගෙවා දැමීමට සමහරුන් ඔහුගේ හිසකෙස් එකින් එක ගලවා දැමූ බවත් එහි ප්‍රතිපලයක් වශයෙන් හිසකෙස් නොමැති හිසක් ඉතිරි විය. එයින් ඔහු මහත් සිත්තැවුලට පත්ව ශිව දෙවියන් හමුවට ගොස් වරයක් යදියි. එනම් නැවත මෙලෙස කිසිවකුගේ හාස්‍යයට ලක් නොවී සිටීමටත් ඔහු විසින් ඇඟිලි දිගු කරන ඕනෑම අයෙක් මැරී වැටෙන්නට සලස්වන ලෙසත්ය. ශිව දෙවියන් එම වරය ඔහුට ලබා දුන්හ. ඉන්මතු නන්දක සමග අනවශ්‍ය ලෙස විහිලු කල දෙවියන් නන්දකගේ ඇඟිලි ඔවුන් වෙත දිගු කිරීම නිසා මරණයට පත් විය. මෙ හේතුව නිසා දෙවියන් අතර ඔහු කෙරෙහි මහත් බියක් ඇති විය. ඔවුන් වහා ශිව වෙතගොස් රැකවරණය ඉල්ලා සිටියහ. ශිව දෙවියන් විසින් නාරායන (විෂ්ණු) දෙවියන් වෙත ගොස් නන්දකගෙන් ඔවුන්ව ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටියහ. එවිට විෂ්ණු දෙවියන් දෙවගනකගේ රුවක් මවාගෙන නන්දක සමීපයට ගොස් ඔහු සමග රැගුම් පැමට පටන් ගති. මෙහිදී දෙවගන

නර්තනයේ යෙදෙන අතරවාරයේ සිය ඇඟිල්ලක් තම පාදයක් දෙසට යොමු කරන අතර රූගුමෙන් මුසපත් වී සිටි නන්දක එය අනුකරණය කරමින් තමාද ඇඟිල්ලක් තමාගේ පාදයක් දෙසට යොමු කරයි. එවිට ඔහුගේ එම පාදය කයෙන් වෙන් වී යයි. නන්දක දුර්වල වූ බව දැන ඔහු ජීවිතක්ෂයට පත් කිරීමට විෂ්ණු සැරසේ. එවිට තමා විෂ්ණුට රැවටුණු බව අවබෝධ කරගත් නන්දක විෂ්ණු හට තදින් දෝෂාරෝපණය කරයි. එවිට විෂ්ණු විසින් එයින් මතු උපත ලබන ආත්මයේදී නන්දක හිස් දහයක් හා අත් විස්සක් සහිතව උපත ලබන බවටත්, තමා එක් හිසක් සහ අත් දෙකක් සහිතව උපත ලබන බවටත් ඔවුන් දෙදෙනා අතර සටනකින් පසු තමා නන්දකව මරා දමන බවටත් අධිෂ්ඨානයකර නන්දකව ඝාතය කරයි. විෂ්ණු අධිෂ්ඨානය අනුවම නන්දක, දසකාන්ත (රාවණා) ලෙසද විෂ්ණු රාමා ලෙසද නැවත උපත ලබයි.




බැංකොක් ග්‍රෑන්ඩ් ප්ලේස් හි වට් ප්‍රා කෙයෝ විහාරයේ ඇති විශාල ටොසකාන් (රාවණා) පිළිමය

**සීතා ගේ උපත -** ටෝසරොට් (Thosarot) නොහොත් දස්රත (Dasratha) රජුගේ ඉල්ලීමක් අනුව කැලයිකොට් (Kalaikot) නොහොත් ඍශියස්රිංග (Rishyasringa) ඍශි විසින් රාජ්‍යයේ උරුමක්කාරයා වෙනුවෙන් යාගයක් කරවන ලදී. යාගය අතරතුර දිව්‍යමය රස ඇති ගුලි 3 ක් බන්දේසියක් මත තබා ගත් භූතයකු ගින්නෙන් මතු විය. මෙම ගුලි වලින් විහිදුනු සුවද ඉතා දුරට විහිදී ටොසකාන් (රාවණා) රජුගේ අගනගරය වූ ලංකාවට ද පැතිරින. ටොසකාන් රජුගේ දේවිය වූ මොන්දෝ Montho) නොහොත් මන්දෝදරී (Mandodari) හට මෙම සුවද සහිත ආහාරය කෑමට තදබල ආසාවක් (මෙය දොල දුකක් විය හැක) ඇති විය. එවිට ටොසකාන් රජු කාකනසුන් (ටටක) නම් යක්ෂණිය මෙම ප්‍රණීත මාංශ ආහාරය ගෙන ඒම සඳහා පිටත් කර යවන ලදී. කාකනසුන් යක්ෂණිය කපුටකුගේ වේශයක් ගෙන අයෝධ්‍යාවට පියබාවුත් මෙම රස ගුලියකින් කොටසක් පමණක් සොරා ගැනීමට සමත් විය. මොන්දෝ දේවිය මෙම ගුලි කොටස අනුභව කොට ගර්භණී බවට පත් විය. පසුව ඇය ගැහැණු දරුවකු ප්‍රසූත කලාය. මෙම දරුවා වාසනාවට අධිපති ලක්ෂ්මී දෙවගනගේ පෙනුමට බොහෝ සමාන පෙනුමකින් යුතු විය. ඇය ඉපදුනු පසු "සියලු යක්ෂ වර්ගයා විනාශ වේවා" යනුවෙන් හඩන ලදී. පිපෙක් (Phiphek) නොහොත් බිබ්සන (Bibhisana) නම් නැකත්කරුවා මෙම අසුභ හැඩීමේ විපාක පෙන්නුම් කරන ලදුව ටොසකාන් විසින් මංජුසාවක දමා මෙම බිලිදා ගංගාවක පා කර හරින ලදී. මෙම දරුවා සහිත මංජුසාව චනොක් (Chnok) නොහොත් ජනක (Janaka) නම් ඍශි වරයාට හමු වේ. මොහු මිතිල (Mithila) රාජධානියේ රජු වූ අතර තවුස් දම් පිරීම පිනිස සිහසුන අත් හැර තිබිණි. තම තවුස් දම් පිරීමට මෙම දරුවා බාධාවක් විය හැකි යැයි සිතු ඔහු මංජුසාව සමග දරුවා වලදමා දරුවා ආරක්ෂා කර දෙන ලෙසට දෙවියන්ට යදින ලදී. සොළොස් අවුරුද්දකට පසු මෙම ඍශිවරයා නැවත සිය

Lak Viskam

රාජධානියට යාමට තීරණය කරයි. වලදැමූ දරුවා සොයා බිම නගුලකින් සීසා බලන විට ඔහු දුටුවේ හොඳින් වැඩුනු රුමත් තරුණියකි. මෙම තරුණිය සීතා (Sitaa) ලෙස නම් කරන ලදී. බිම සීසාද්දී මතු වූ නිසා සීතා ලෙස නම් කල බවත් හොඳින් රැක බලා ගත් බවටත් සඳහන් වේ.

**රමස්යින් (Ramasiin) / රාමසුර (Ramasura) පිළිබඳ කොටස**

වසත් කාලය උදාවත්ම සුරපුර දේව දේවතාවියන් එය මහත් වූ කෙළිදෙලින් සමරති.ඉතා අගනා මාණික්‍යයකට උරුම කම් කියන  මහා සාගරයට අධිපති දෙවගන වූ මනිමේඛලා ද (Manimekhala) එහි විය. අසමසම බලයක් ඇති රාමසන් (Ramasun) නමැති යක්ෂයා දෙව් ලොව වෙත ලගා වෙමින් සිටින අතරවාරයේ මනිමේඛලා දෙවගන තම වටිනා මාණික්‍යය සමග ක්‍රීඩාවේ යෙදී සිටිනා අයුරු දකී. එය පැහැර ගැනීමට සිත් පහල වී දෙවගන පසුපස හඹා ගොස්  මාණික්‍යය පැහැර ගැනීමට උත්සහාගනී. ඔහු සිය පොරොව දෙවගන දෙසට විසි කලත් මාණික්‍යයේ බලයෙන් ඇය එය මග හැරීමට සමත් වේ. මෙම පසුපස හඹා යාම අදටත් සිදු වන බවටත් පොරොව විසිකිරීම හා දෙවගන ඉන් ගැලවීමට මාණික්‍යය අධාරයෙන් කරන චලනලයන් නිසා අකුණු ගැසීම් හා අහස ගිගුරුම් දීම සිදු වන බවටත් පැවසේ. මේ අවස්ථාවේ අර්ජුන (Arjuna) නම් දෙවියාද දෙව් ලොව කරා ගමන් කරන අතර රාමසන් විසින් ඔහුව අල්ලා මෙරු (Meru) කන්ද දෙසට විසි කරයි. මේ හේතුව නිසා මෙරු කන්ද එක් පසෙකට ඇල වෙයි. ඊස්වර (ශිව) සියලු බලවන්ත්යින්ගෙන් මෙම කන්ද නැවත පෙර තිබු තත්වයට පත් කරන ලෙස ඉල්ලා සිටී. මෙම සියලු බලවන්තයින්ගේ උත්සාහයන් අසාර්ථක වීම හමුවේ ඊස්වර එම කාර්යය කකාස් (Kakas) නොහොත්  පහාලි (Pahali) / වාලින්  (Valin) සහ සුග්‍රිබ් (Sugrib) නොහොත් සුග්‍රීවා (Sugriva) යන දෙදෙනාට පවරයි. ඔවුන් එම කන්ද නැවත ප්‍රකෘර්ති තත්වයට ගෙන ඒමට සමත් වේ. රාමසන් (Ramasun) ප්‍රත්‍යක්ෂවම පරසුරාම (Parasurama) හා අර්ජුන (Arjuna) නොහොත් කර්ථවීර්යජුන (Kartaviryajuna) යන අය අත් දහසක් සහිත නර්මදා නදියේ මහිස්මති ය  (Mahismati) පාලනය කල හෙහාය (Hehaya) නම් රාජවංශයේ වෙති.

පහාලි (Pahali)  විසින් ටොසකාන් (Tosakan) අල්ලා ගත් අවස්ථාවක් පිළිබඳව එක් කථාංග කොටසක මෙසේ සටහන් වී ඇත.

පහාලි ගේ පුත්‍රයා වන අංගාද ඔහුට අවුරුදු 10දී ගඟ අසබඩට ගෙන ගොස් එහි තනියම ක්‍රීඩා කිරීමට ඉඩ හැර ඇත. මේ අතරවාරයේ එහි පැමිණි ටොසකාන් (Tosakan) මේ පහාලි ගේ පුත්‍රයා බව දැන ඔහු මරා දැමීමට සැරසේ. ටොසකාන් විශාල කකුලුවකුගේ වේශයක් ගෙන පිරිමි දරුවා ජලයට පැමිණෙන තුරු ජලයේ සැඟ වී බලා සිටී. අවට ලැග සිටි වානර සෙබළුන් මෙම විශාල කකුළුවා දැක ඌ අල්ලා ගැනීමට උත්සහා කලත් එය නිෂ්ඵල විය. පසුව වානරයින් මේ බව පහාලි හට දැනුම් දේ. පහාලි පැමිණි වහාම කකුළු වේශය අතහැර නියම ස්වරූපයට පැමිණ පහාලි හා සටන් කරයි. අවසානයේදී ටොසකාන් ව පහාලි විසින් අල්ලා ගෙන සිරකරුවකු ලෙස දින 7 ක් රඳවා ගනී. මේ අතරවාරයේ වානරයන් විසින් ඔහුව තද බල ලෙස නින්දා අපහාසයන්ට ලක් කරන ලදී.

**ටොසකාන් විසින් මොන්දෝ දේවිය ලබා ගැනීම පිළිබඳ කොටස**

මොන්දෝ නොහොත් මන්දෝදරී දේවිය පෙර ආත්මභාවයේදී ඍෂිවරු සතර දෙනෙක් දුන් කිරි මත මැඩියකු ලෙස ජීවත් විය. දිනක් නාගලෝකයෙන් ආ විශාල හැපින්නියක් මෙම ඍෂින් සතර දෙනා විසූ අසපුවට පැමිණේ. ඇය එසේ පැමිණියේ දිනක් මෙම හැපින්නිය නාගයකු සමග සංවාසයේ යෙදෙන අතර ඍෂින් විසින් ඇගේ වලිගයට පහර දීම නිසා එම ක්‍රියාවට පලි ගැනීමටය. ඍෂින් අසපුවේ නැති අතර ඔවුන්ගේ කිරි භාජන වලට සිය විෂ වමාරා ඒවා විෂ සහිත කිරි බවට පත් කරයි. මෙය දුටු මැඩියා තම කෙලෙහිගුණ ඍෂිවරු කෙරෙහි පළකරමින් එක් කිරි භාජනයකට පනී. නාග විෂෙන් මැඩියා භාජනය තුල මිය යයි. පෙරලා පැමිණි ඍෂිවරු මැඩියාගේ ක්‍රියාව වටහාගෙන ඌ නිසා තම දිවි ගැලවුණු බව වටහා ගනී. මේ ක්‍රියාව කෙරෙහි සතුටු වූ ඔවුන් මැඩියාට නැවත ප්‍රාණය ලබා දී ඉතා ප්‍රියකරු තරුණියක් බවට පරිවර්තනය කරයි. එසේම උමා දෙව් දුවගේ මෙහෙකාරිය බවටද පත් කරයි.

වරක් විරුල්හාක (Virulhaka) සිය කර හරහා පළඳින උපවිත නම් පටිය මෙරු (Meru)  කන්ද දෙසට විසි කිරීමෙන් එය පසෙකට ඇලවී තිබේ. ශිව දෙවියන් කන්ද නැවත සකස් කර දෙන ලෙස ටොසකාන්ට (Tosakan) දැනුම් දී ඇත. ඔහු එය ඉටු කල පසු ත්‍යාගයක් පිරිනැමීමට ශිවට සිදු වී ඇත. ඒ අනුව ටොසකාන්ගේ ඉල්ලීම අනුව් උමා දෙව් දුව ඔහුට ලබා දීමට සිදු විය. උමාව ලබා ගත් ටොසකාන් ඇයව ලංකාවට ගෙන යාමට සිදු වූයේ ඔහුගේ හිස මත තබාගෙනය. මෙයට හේතුව උමාගේ ශරීරය ඉතා උණුසුම් වූ බැවිනි. මේ අතරවාරයේ විෂ්ණු ටොසකාන්ගේ ගමනට

Lak Viskam

විවිධ බාධා කිරීම් කරමින් සිටී. විෂ්ණු මහල්ලකුගේ වෙස් ගෙන පැලයක් උඩු යටිකුරු කර රෝපණය කරමින් ටොසකාන්ගේ ගමන් මාර්ගයේ සිටී. මෙය දුටු ටොසකාන් මහල්ලා වෙත "නුඹ මහත් මෝඩයකු යැයි" පැවසීය. එවිට මහල්ලා ටොසකාන්ට  තමාට වඩා ඔහු මෝඩයකු බවත්, ශරීරය ඉතා උණුසුම් ස්ත්‍රියක ගෙන යාමෙන් යක්ෂ ගෝත්‍රයම පිලිස්සී විනාශ වන බවත් පවසන ලදී. එයින් වැලකීම පිණිස ශිව ගෙන් උමා වෙනුවට මොන්දෝ ව ඉල්ලා ගන්නා ලෙසත් පවසන ලදී. මෙම මහලු මිනිසාගේ උපදෙස් අනුව යමින් උමා අතහැර මොන්දෝ ව රැගෙන අහසින් ලංකාවට ගෙන ගියහ. මෙම ගමනේදී පහාලි (Pahali) නොහොත් වාලින් ගේ (Valin) මාලිගය ඉහලින් ඔවුන්  ගමන් කරන ලදී. මෙහිදී පහාලි ටොසකාන්ට තමන් සමග සටනට එන ලෙස අභියෝග ලද අතර මෙම සටනේදී ටොසකාන් පරාජය වී මොන්දෝව පහාලි වෙත ලබා දීමට සිදු වේ. ටොසකාන් අන්ගඩ් (Angad) නම් ආචාර්යවරයා මාර්ගයෙන් මොන්දෝව නැවත ඉල්ලා සිටී. ඇයව නැවත ලබා දීමට එකග වුවත් ඒ වන විට මොන්දෝ ගර්භනීයකව සිටී. මේ නිසා අන්ගඩ් හට මෙම ගැබ මොන්දෝ ගෙන් ඉවත්කර එළු දෙනකගේ ගර්භාශයේ තැම්පත් කිරීමට සිදු වේ. ප්‍රසූත කාලයේදී ඍෂි විසින් එළුදෙනගේ ගර්භාෂයෙන් දරුවා ලබාගෙන අන්ගාද ලෙස නම් කර පහාලි වෙත ලබා දේ. (පෙර පරිච්ඡේදයේ සදහන් වූයේ මෙම අන්ගාද නම් දරුවා සම්බන්ධ කථාවකි).

**බෙන්යකේ  (Benyakay) පිළිබද කොටස**

රාමගේ වානර හමුදාව මුහුදු වෙරළේ කදවුරු බැඳ මුහුද පසු කර ලංකාවට පැමිණීමට සූදානම් වන අතරවාරයේ ටොසකාන් සිතා ජීවතුන් අතර නොමැති බවට රාමාට ඒත්තු ගන්වා මුළා කිරීමට අවශ්‍යා විය. මේ සඳහා ඔහු හිබීෂනගේ දියණිය බෙන්යකේ-රාවණාගේ ලේලිය (සංස්කෘත භාෂාවෙන්: Pancakaya) යොදා ගනී. ඇය සීතා දේවියට සමාන රුවක් මවාගෙන මළමිණියක්සේ රාමගේ කදවුර අසල ජලයේ පා වෙමින් සිටී.




රාවණාගේ ලේලිය ඔහුගෙන් උපදෙස් ලබා ගන්නා ආකාරය හා සීතාගේ මළමිනිය මෙන් ජලයේ පාවෙන අයුරු

සීතාගේ මෘත දේහය දුටු රාම සහ ලක්ෂමන මහත්සේ ශෝකයෙන් වැළපේ. හනුමන් ලංකාව ගිනි තබා විනාශ කිරීම නිසා ටොසකාන් උරණ වී, ඉක්මන් වී සීතාගේ දිවි තොර කරන්නට ඇති බවට අනුමාන කරන රාම හනුමාන් සමග උරණ වෙයි. මෙවිට හනුමාන් ඉතා තියුණු ලෙස පාවෙන ශරීරය දෙස බලා එය උඩුගං බලා පාවෙන බවට නිරීක්ෂණය කරයි. මේ හේතුව නිසා මෙය මායාවක් බවට සැකසිතා එය තහවුරු කර ගැනීමට මෙම සිරුරේ කොටසක් පුළුස්සයි. පිළිස්සීම නිසා බෙන්යකේ වහා හනුමාන්ගෙන් මිදී ඉගිල්ලී යයි. හනුමාන් ඇයව හඹා ගොස් අල්ලා ගනී. පසුව හනුමාන් සමග ඇති වූ සබතාවයෙන් ඇය අසුරපාද් (Asuraphad) නමින් පුතෙක් ලංකාවේදී බිහි කරයි.

**ස්වම්නම්ච්චා / ස්වම්මත්සා (Suvamnamaccha or Suvamamatsya) පිළිබද කොටස**

ටොසකාන් මත්සායකු සමග පැවති සමීප ඇසුරක් නිසා ස්වම්මත්සා නමින් දියණියක බිහි විය. මෙම දියණියගේ ශරීරයේ ඉහළ කොටස ඉතා ලස්සන ගැහැණු දරුවෙකුගේද පහල කොටස මත්සායකුගේ ආකාරයටද (දියකිදුරි)

LakViskam

විය. රාම ලංකාව වෙත මුහුදින් ගමන් කිරීමට පාලමක් ඉදි කිරීම ආරම්භ කල විට ටොසකාන් සිය දියණියට එම පාලම ඉදි කිරීම වලකන ලෙස නියෝග කරයි. ඇයගේ නායකත්වයෙන් යුතු මුහුදු ජීවීන්ට නියෝග කෙරුනේ වානර හමුදාව විසින් මුහුදට දමන පාලම් ඉදි කිරීම සදහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඉවත් කරන ලෙසටය.







රාවණාගේ දියකිදුරි දියණිය හා මුහුදු ජීවීන් රාමගේ පාලමේ අමුද්‍රව්‍ය හොරෙන් ඉවත් කරන අයුරු

මෙවිට හනුමාන් දිය යට කිමිදී අමුද්‍රව්‍ය අතුරුදහන් වීමට හේතුව සොයා බලයි. ඔහුට දියකිදුරිය හමුවන අතර ඇය පාලම ඉදි කිරීමට කරන අවහිරතා වලකාලයි. මෙම හමුවීමේදී ඇයව තමා වෙත නම්මවාගෙන සංවාසයේ යෙදීමේ ප්‍රතිපලයක් වශයෙන්  දියකිදුරිය ගැබ් ගෙන පුතකු බිහි කරයි.

Lak Viskam






හනුමා මුහුදු මකරෙකු සමග පොරබදන අයුරු හා රාවණාගේ දියකිදුරු දියණිය හා හනුමාන්

මේ පිලිබදව හනුමාන් දැන නොසිටී. මෙම දරුවා වානර-දියකඳුරු සංකලනයක් වූ අතර  ඔහු මචානු (Machanu) නම් වේ (සංස්කෘත භාෂාවෙන්: Matsya+hanu). පාතාල් (Patal) හී රජුවන මයියරාබ් (Maiyarab, Mayarabn=Mahiravana) විසින් මචානු දරු කමට හදා වඩා ගනී. මයියරාබ් රජු විසින් වරක් රාම ව ඔහු නින්දේ

පසුවන විට පාතාල් වෙත රැගෙනවිත් යකඩ ගුහාවක හිර කර තබයි. රාම ව බේරා ගැනීම පිණිස පාතාල් වෙත ගිය හනුමාන් දූටු මචානු ඒ තමාගේ පියා බව දැන ගනී.

**මයියරාබ් (Maiyarab) පිළිබද කොටස**

මයියරාබ් රජු  ටොසකාන් හට උදව් කිරීමට ඉදිරිපත් වේ. ඒ අනුව සියලු මායා ශක්තීන් යොදා මයියරාබ්ගේ ආත්මය ඉවත් කර එය මී මැස්සෙකු බවට හරවා ත්‍රිගුට (Triguta) කන්දේ සගවයි. ඉන් පසුව රාමගේ කඳවුරට යන ඔහු තම බෙහෙත් වර්ග හා මායා බලය යොදා එහි සියලුදෙනා තද නිද්‍රාවට පත්කර රාමව රැගෙන විත්  පාතාල්හී යකඩ ගුහාවක හිර කර තබයි. මයියරාබ්ගේ මායා බලය අවසන් වූ පසු අවදි වූ හනුමාන් විවිධ බාධක මැඩගෙන පාතාල් වෙත යයි. මෙම ගමනේදී සිය පුතකු වූ මචානු හමු වන අතර රාමා සොයා ගැනීමට හනුමාන්ට පිරාකවුන් (Phirakuan) නම් මයියරාබ්ගේ වැඩිමහල් සොයුරියගෙන් උදව් ලැබේ. මයියරාබ්ට තුවාල නොවන රහස් දැන ගත් හනුමාන් සිය ශරීරය ඉතා විශාල කරගෙන මයියරාබ්ගේ ආත්මය සහිත මී මැස්සාද මරා දමා රාම ව බේරාගෙන නැවත පැමිණේ.

(මෙම කොටස වාල්මිකී රාමායනයේ දක්නට නොලැබේ)

***නිශාන් කුළසිංහ විසිනි***

Lak Viskam